# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2260/43 - 2021 දෙසැම්බර් මස 28 වැනි අඟහරුවාදා - 2021.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* 11/3/3/1/23C.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2010/MV/53.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතෙන් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1 කිරිඔය වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2021.10.18 දින සම්මත කරන ලද භූලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 25 හි, අතුරු පිඹුරු අංක 199 හි, පත්‍ර අංක 220 දරන සැලැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2.3611ක් වන පහත විස්තර සඳහන් ඉඩම්:

01. කැබලි අංකය 9235
ඉඩමේ නම: දිගන්නාව ඉඩම; විස්තරය : වත්ත; හිමිකම් කියන අය: රජය; අනවසර වගාකරු: අතරගල්ලෑව, කිරිඔය පදිංචි ජේ. ජී. ආරියපාල; ප්‍රමාණය:- හෙක්. 0.0085.

02. කැබලි අංකය 9236
ඉඩමේ නම: දිගන්නාව ඉඩම; විස්තරය : වත්ත; හිමිකම් කියන අය: රජය; අනවසර වගාකරු: අතරගල්ලෑව කිරිඔය පදිංචි ඩබ්. ප්‍රියන්ත; ප්‍රමාණය:- හෙක්. 0.3131.

03. කැබලි අංකය 9237
ඉඩමේ නම: දිගන්නාව ඉඩම; විස්තරය : වත්ත; හිමිකම් කියන අය: රජය; අනවසර වගාකරු: අතරගල්ලෑව කිරිඔය පදිංචි පී. ජී. දීපිකා කුමාරි; ප්‍රමාණය:- හෙක්. 0.4387.

04. කැබලි අංකය 9238
ඉඩමේ නම: දිගන්නාව ඉඩම; විස්තරය : කුඹුර; හිමිකම් කියන අය: රජය; අනවසර වගාකරු: අතරගල්ලෑව කිරිඔය පදිංචි ඩබ්. ප්‍රියන්ත; ප්‍රමාණය:- හෙක්. 0.6021.


G 35700 - 10 (2021/12)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

05. **කැබලි අංකය 9239**

ඉඩමේ නම: දිගන්නාව ඉඩම; විස්තරය : කුඹුර; හිමිකම් කියන අය: රජය; අනවසර වගාකරු: හත්තොට අමුණ, මාඔය, 21 කණුව පදිංචි ජී. ජී. විජේරත්න; ප්‍රමාණය:- හෙක්. 0.9987.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.01.25 වැනි දින පෙ. ව. 9.00ට ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022.01.19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එස්. විජයකුමාර්**,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2021 දෙසැම්බර් මස 23 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0317

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.